**පීපල්ස් මයික්‍රො කොමර්ස් ලිමිටඩ් - 2024/2025**
---------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන
### 1.1 මතය

පීපල්ස් මයික්‍රො කොමර්ස් ලිමිටඩ් ("සමාගම") හි 2025 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2025 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මෙම විගණනය සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදී සිටින වරලත් ගණකාධිකාරී සමාගමක සහය මා ලබාගන්නා ලදී.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2025 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම
සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු

කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 නොසැසඳූ පාලන ගිණුම් සහ වාර්තා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බැංකු සැසඳීම සඳහා ගත් GL ශේෂය සහ සත්‍ය GL ශේෂය අතර රු. 1,011,400 ක වෙනසක් නිරීක්ෂණය විය. | IT කණ්ඩායමට පමණක් විසඳා ගත හැකි තාක්ෂණික ගැටළුවක් නිසා නොගැලපීම හඳුනා ගැනීමට වැඩි කාලයක් අවශ්‍ය විය. කෙසේ වෙතත් විගණනයේදී මෙම අපගමනය නිවැරදි කරන ලදී. | සාමාන්‍ය ලෙජරයේ (GL) ශේෂයන් සහ සැසඳීම සඳහා භාවිතා කරන ශේෂයන් අතර විෂමතා වැළැක්වීම සඳහා බැංකු සැසඳුම් ක්‍රියාවලිය පිළිබඳ පාලනයන් කළමනාකාරිත්වය විසින් ශක්තිමත් කිරීම නිර්දේශ කරනු ලැබේ. |

## 1.6 තොරතුරු තාක්ෂණ පොදු පාලන ක්‍රම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2025 මාර්තු 31 වන විට, ඉල්ලා අස්වූ සේවකයාගේ පරිශීලක ගිණුම් අක්‍රිය කර නොමැති බවත්, ඒවා මයික්‍රොෆින් පද්ධතියේ ක්‍රියාකාරීව පවතින බවත් අදාළ ඉල්ලා අස්වීමේ දිනයෙන් පසු, InBank සහ MicroFin පද්ධතිවල ඇතැම් ගිණුම් කාලෝචිත පදනමක් මත අක්‍රිය කර නොමැත.<br><br>තෝරාගත් නියැදියට අනුව, ඉල්ලා අස්වූ සේවකයෙකුගේ අක්‍රිය නොකළ මයික්‍රොෆින් පද්ධතියේ ක්‍රියාකාරීව පවතින පරිශීලක ගිණුම පිළිබඳ විස්තර පහත වගුවේ දැක්වේ. | ඉල්ලා අස්වීමේ ලැයිස්තුව නියමිත වේලාවට එවන ලෙස පීපල්ස් මයික්‍රෝ කොමර්ස් ලිමිටඩ් හි මානව සම්පත් දෙපාර්තමේන්තුව වෙත දන්වා තිබේ. | ඉල්ලා අස්වූ සේවකයින්ගේ පරිශීලක ගිණුම් මයික්‍රොෆින් පද්ධතිය තුළ වහාම අක්‍රිය කිරීම සහතික කිරීම සඳහා කළමනාකාරිත්වය විසින් පරිශීලක ප්‍රවේශ කළමනාකරණ පාලනයන් ශක්තිමත් කළ යුතුය. |

| පරිශීලක හැඳුනුම්පත් අංකය | පරිශීලක තත්ත්වය (සටහන 1) | අවසන් පිවිසුම් දිනය (වර්ෂය/ මාසය/දිනය) | ඉල්ලා අස්වූ දිනය (වර්ෂය/ මාසය/දිනය) |
|---|---|---|---|
| ආර්. විනෝද්‍යා | ඔව් | 2025/01/15 | 2025/01/26 |

මයික්‍රොෆින් පද්ධතියේ පරිශීලක ගිණුම අක්‍රිය කිරීමේ ක්‍රියාවලියේ පවතින සැලකිය යුතු ප්‍රමාදයන්ට අදාළ විස්තර පහත වගුවේ දැක්වේ.

| සේවක අංකය | පරිශීලක හැඳුනුම්පත් අංකය | අක්‍රිය කිරීමේ දිනය (වර්ෂය/මාසය/දිනය) | ඉල්ලා අස්වූ දිනය (වර්ෂය/මාසය/දිනය) | ප්‍රමාදය (සටහන 3) |
|---|---|---|---|---|
| 30751 | යූ. ඉන්දිකා | 2024/05/09 | 2024/05/06 | 3 |
| 30755 | බී.ඒ. ඉසුරු | 2024/10/15 | 2024/10/07 | 8 |
| 30769 | ආර්.බී. දිල්ශාන් | 2024/05/09 | 2024/05/03 | 6 |
| 30774 | කේ.ශෙනාලි | 2024/05/27 | 2024/04/08 | 49 |
| 30777 | එම්.ආර්.තිසර | 2024/06/20 | 2024/06/18 | 2 |
| 30832 | යූ.චමිදු | 2024/08/15 | 2024/06/26 | 50 |
| 30807 | ආර්.රමේෂ් | 2024/11/05 | 2024/10/26 | 10 |
| 30809 | සී.කේ. සෞම්‍යා | 2024/08/15 | 2024/08/10 | 5 |
| 30811 | එම්.එස්.හෂාන් | 2024/09/30 | 2024/09/25 | 5 |
| 30812 | එල්. නවීන් | 2024/06/30 | 2024/06/28 | 2 |
| 30816 | ඒ.සමුදි | 2024/01/02 | 2024/10/31 | 63 |
| 30817 | ඒ.හෙෂානි | 2024/06/30 | 2024/06/25 | 5 |
| 30819 | ඒ.ලක්රුවන් | 2024/06/30 | 2024/06/28 | 2 |
| 30826 | ඒ.වී.තරිඳු | 2024/10/04 | 2024/09/27 | 7 |
| 30838 | ඩී.විහඟ | 2024/06/20 | 2024/05/10 | 41 |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 254,640,669 ක බදු පෙර ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු. 186,155,736 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 68,484,933 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට පොලී ආදායම රු. 190,206,068 කින් ඉහළ යාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ සහ ඊට පෙර වසර හතරක කාලය තුළ සමාගමේ මූල්‍ය ප්‍රතිඵල පහත වගුවෙහි සාරාංශ ගත කර තිබේ.

| වර්ෂය | 2024/2025 | 2023/2024 | 2022/2023 | 2021/2022 | 2020/2021 |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| **සමාගම** | | | | | |
| **පොලී ආදායම** | **1,075,853,992** | **885,647,924** | **765,081,162** | **793,186,355** | **819,027,057** |
| විචලතාව | 190,206,068 | 120,566,762 | (28,105,193) | (25,840,702) | 23,972,379 |
| වැඩිවීම/(අඩුවීම) % | 21.48% | 15.76% | -3.54% | -3.16% | 3.02% |
| **ගාස්තු සහ කොමිස් ආදායම** | **142,820,045** | **52,513,481** | **25,198,879** | **62,959,329** | **48,967,426** |
| විචලතාව | 90,306,564 | 27,314,602 | (37,760,450) | 13,991,903 | 2,169,239 |
| වැඩිවීම/(අඩුවීම) % | 171.97% | 108.40% | -59.98% | 28.57% | 4.64% |
| **පොලී වියදම** | **279,562,026** | **388,057,922** | **514,286,414** | **793,186,355** | **218,015,318** |
| විචලතාව | (108,495,896) | (126,228,492) | (278,899,941) | 575,171,037 | (47,144,089) |
| වැඩිවීම/(අඩුවීම) % | -27.96% | -24.54% | -35.16% | 263.82% | -17.78% |
| **හානිකරණ ගාස්තු** | **17,988,539** | **(65,080,134)** | **(112,894,051)** | **45,484,291** | **119,971,127** |
| විචලතාව | 83,068,673 | 47,813,917 | (158,378,342) | (74,486,836) | (76,938,211) |
| වැඩිවීම/(අඩුවීම) % | -127.64% | -42.35% | -348.20% | -62.09% | -39.07% |
| **පෞද්ගලික වියදම්** | **291,905,653** | **192,339,946** | **161,785,320** | **142,204,009** | **139,934,699** |
| විචලතාව | 99,565,707 | 30,554,626 | 19,581,311 | 2,269,310 | 2,966,841 |
| වැඩිවීම/(අඩුවීම) % | 51.77% | 18.89% | 13.77% | 1.62% | 2.17% |
| **ආදායම් බදු වියදම්** | **101,803,214** | **75,145,446** | **22,025** | **79,766,376** | **69,377,355** |
| විචලතාව | 26,657,768 | 75,123,421 | (79,744,351) | 10,389,021 | 45,894,876 |
| වැඩිවීම/(අඩුවීම) % | 35.47% | 341082.50% | -99.97% | 14.97% | 195.44% |
| **වර්ෂය සඳහා ශුද්ධ ලාභය** | **152,837,455** | **111,010,290** | **67,028,756** | **196,856,866** | **132,678,926** |
| විචලතාව | 41,827,165 | 43,981,534 | (129,828,110) | 64,177,940 | 107,186,875 |
| වැඩිවීම/(අඩුවීම) % | 37.68% | 65.62% | -65.95% | 48.37% | 420.47% |
| **බදු පෙර ලාභය** | **254,640,669** | **186,155,736** | **67,050,781** | **276,623,242** | **202,056,281** |
| විචලතාව | 68,484,933 | 119,104,955 | (209,572,461) | 74,566,961 | 153,081,751 |
| වැඩිවීම/(අඩුවීම) % | 36.79% | 177.63% | -75.76% | 36.90% | 312.57% |

### 2.3 අනුපාත විශ්ලේෂණය

ලබාගත හැකි වූ තොරතුරු වලට අනුව, සමාලෝචිත වර්ෂයේ හා පෙර වර්ෂයන්හි සමාගමේ වැදගත් අනුපාත පහත වගුවේ දැක්වේ.

| සමාගමට අදාළව නිශ්චිත අනුපාතය | 2024/25 | 2023/24 | 2022/23 | 2021/22 | 2020/21 |
|---|---|---|---|---|---|
| වත්කම් මත ප්‍රතිලාභය (%) | 3.08 | 3.77 | 2.54 | 6.41 | 4.94 |
| හිමිකම් මත ප්‍රතිලාභය (%) | 19.75 | 17.82 | 13.08 | 37.96 | 36.09 |
| ශුද්ධ ලාභ අනුපාතය (%) | 12.54 | 11.83 | 8.48 | 22.99 | 15.29 |
| ණය හිමිකම් අනුපාතය (වාර ගණන) | 5.41 | 3.72 | 4.14 | 4.92 | 6.3 |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 වාහන සංචිතය කළමනාකරණය කිරිම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පීපල්ස් මයික්‍රෝ-කොමර්ස් ලිමිටඩ් (PML) හි වාහන ලියාපදිංචි කිරීම් පිළිබඳ විගණන පරීක්ෂණයේදී මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව (RMV) විසින් පවත්වාගෙන යනු ලබන වාර්තා සහ සමාගම විසින් පවත්වාගෙන යනු ලබන වාර්තා අතර විෂමතා අනාවරණය විය. RMV දත්ත වලට අනුව, 2025 මාර්තු 6 වන දින වන විට සමාගමේ නමින් වාහන හතරක් ලියාපදිංචි කර ඇති අතර, 2025 පෙබරවාරි 21 වන විට සමාගම වාර්තා කර ඇත්තේ එක් වාහනයක හිමිකාරිත්වය පමණි. තවද, RMV වාර්තාවලට අනුව සමාගමේ නම යටතේ ලියාපදිංචි කර ඇති වාහන දෙකක් 2025 අප්‍රේල් 23 වන විට යාවත්කාලීන කර හෝ මාරු කර නොතිබුණි. එයට අතිරේකව, අනතුරු හේතුවෙන් සම්පූර්ණයෙන්ම හානි වී ඇති බවට ප්‍රකාශයට පත් කර ඇති සහ රක්ෂණ හිමිකම් දැනටමත් ක්‍රියාත්මක වෙමින් පවතින BHU–2420 සහ BIQ–6580 අංක දරන වාහන, RMV වාර්තාවල අඛණ්ඩව සමාගමේ හිමිකාරිත්වය යටතේ දක්වා තිබිණි. මෙම නොගැලපීම් වාහන ලියාපදිංචි වාර්තා අධීක්ෂණය කිරීමේ සහ යාවත්කාලීන කිරීමේ දුර්වලතා පෙන්නුම් කරයි. සමාගමේ වත්කම් | වාහන ලියාපදිංචි වාර්තාවල ඇති විෂමතා සම්බන්ධයෙන් කරන ලද නිරීක්ෂණ කළමනාකාරිත්වය විසින් පිළිගන්නා ලදී. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ (RMV) වාර්තා යාවත්කාලීන කිරීමට සහ සම්පූර්ණ අලාභ ලෙස වාර්තා වූ වාහනවල හිමිකාරිත්වය පැවරීමට හෝ අවලංගු කිරීමට සමාගම විසින් දැනටමත් අවශ්‍ය ක්‍රියාමාර්ග ආරම්භ කර තිබේ.රක්ෂණ හිමිකම් පියවීම් සම්පූර්ණ කිරීමේදී සහ අදාළ බලධාරීන්ගෙන් නිෂ්කාශනය ලබා ගැනීමේදී ඇති වූ ක්‍රියා පටිපාටිමය අවශ්‍යතා හේතුවෙන් RMV වාර්තා යාවත්කාලීන කිරීමේ ප්‍රමාදයන් සිදුවිය.අනාගතයේදී වාහන ලියාපදිංචි කිරීමේ තොරතුරු සමාගමේ ස්ථාවර වත්කම් වාර්තා සමඟ නිසි ලෙස සැසඳීම සහතික කිරීම සඳහා නිවැරදි කිරීමේ පියවර ගනිමින් සිටින බවට කළමනාකාරිත්වය සහතික කරයි. | සමාගමේ වාර්තා සහ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව (RMV) විසින් නඩත්තු කරනු ලබන වාර්තා අතර නිරවද්‍යතාවය සහ අනුකූලතාව සහතික කිරීම සඳහා කළමනාකාරිත්වය විසින් වාහන ලියාපදිංචි කිරීමේ වාර්තා අධීක්ෂණය සහ යාවත්කාලීන කිරීම පිළිබඳ පාලනයන් ශක්තිමත් කළ යුතුය. සියලුම වාහන මිලදී ගැනීම්, බැහැර කිරීම්, සම්පූර්ණ අලාභ සිදුවීම් සහ හිමිකාරිත්ව හුවමාරුව වහාම RMV වෙත දැනුම් දෙනු ලබන අතර සමාගම් වාර්තා සහ RMV වාර්තා දෙකෙහිම ප්‍රමාදයකින් තොරව යාවත්කාලීන කරනු ලබන බව සහතිකපනය කිරීම සඳහා විධිමත් ක්‍රියාමාර්ගයක් ගත යුතුය. |

පිළිබඳ නිවැරදි වාර්තා පවත්වා ගැනීම සඳහා කාලීන අවලංගු කිරීම් සහ හිමිකාරිත්වය පැවරීම් සහතික කිරීම සඳහා කළමනාකාරිත්වයේ අවධානය අවශ්‍ය වේ.